විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය කාර්යාලය
வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சர் அலுவலகம்
OFFICE OF MINISTER OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM
ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1, ශ්‍රී ලංකාව குடியரசுக் கட்டிடம், கொழும்பு 1, இலங்கை Republic Building, Colombo 1, Sri Lanka

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | MFA/M/PR/26/17 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2026.06.15 |

## මාධ්‍ය නිවේදනය

**<u>වධහිංසා පැමිණවීම් සම්බන්ධයෙන් වත්මන් රජය පැහැදිලිවම "ශුන්‍ය ඉවසීමේ ප්‍රතිපත්තියක්" (Zero Tolerance Policy) අනුගමනය කරයි - එක්සත් ජාතීන්ගේ වධහිංසා වැළැක්වීමේ අනුකමිටුවට අමාත්‍ය විජිත හේරත් පවසයි - ( වීඩියෝ - https://we.tl/t-Kz2gotynMfOZPz9B )</u>**

2026 ජූනි 15 සිට 24 දින දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරතව එක්සත් ජාතීන්ගේ වධහිංසා වැළැක්වීමේ අනුකමිටුවේ (SPT) විශේෂ සිවිපුද්ගල නියෝජිත පිරිස අද දින විදේශ, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේදී විශේෂ වැඩසටහනකට සහභාගී වුණා.

මෙහිදී අදහස් දැක්වූ විදේශ අමාත්‍යවරයා, විශේෂයෙන්ම, වධහිංසා පැමිණවීම් සම්බන්ධයෙන් වත්මන් රජය පැහැදිලිවම "ශුන්‍ය ඉවසීමේ ප්‍රතිපත්තියක්" (Zero Tolerance Policy) අනුගමනය කරන බව අවධාරණය කළේය. මෙම ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා ව්‍යවස්ථාදායක, පරිපාලනමය සහ ආයතනික පියවර රැසක් මේ වන විටත් ගෙන ඇති අතර, ඒවායේ ප්‍රගතිය අඛණ්ඩව ඉදිරියට යමින් පවතින බවද ඔහු කියා සිටියේය.

ශ්‍රී ලංකාව ප්‍රධාන ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් නවයටම (09 core international human rights Treaties) පාර්ශවකරුවෙකු වූ රාජ්‍යයක් බව පෙන්වා දුන් අමාත්‍යවරයා, මෙම සංචාරය හරහා ස්වේච්ඡාවෙන් භාරගත් බැඳීම්වලට අනුකූල වීම ශක්තිමත් කිරීමට රජයට ඇති කැපවීම මනාව පිළිබිඹු වන බව සඳහන් කළේය. එමෙන්ම, මානව හිමිකම් ආරක්ෂා කිරීමටත්, නීතියේ ආධිපත්‍යය සුරැකීමටත්, යහපාලනය ශක්තිමත් කිරීමටත් රජය සතු නොසැලෙන කැපවීම ඔහු මෙහිදී නැවත වරක් ස්ථිර කර සිටියේය. ශ්‍රී ලංකා රජය මෙම අනුකමිටුව සමඟ විවෘත, ඉදිරිගාමී සහ විනිවිදභාවයෙන් යුත් ආකාරයකින් කටයුතු කරන බවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව මෙම සියලු කටයුතු සඳහා රජයේ පූර්ණ සහයෝගය ලබාදෙන බවත් ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

ශ්‍රී ලංකාව 2017 වසරේ දෙසැම්බර් මාසයේදී වධහිංසාවට සහ අනෙකුත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකිලිවලට හෝ දඬුවම්වලට එරෙහි සම්මුතියේ විකල්ප ප්‍රොටෝකෝලයට (OPCAT) අත්සන් තැබීමෙන් පසුව, එක්සත් ජාතීන්ගේ වධහිංසා වැළැක්වීමේ අනුකමිටුව මීට පෙර 2019 අප්‍රේල් මාසයේදී සිය ප්‍රථම සංචාරය මෙරටට සිදු කළේ ය. එහි දෙවන සංචාරය ලෙස අයිෂා ෂුජුන් මුහම්මද්ගේ (Ms. Aisha Shujune Muhammad - මාලදිවයින) ප්‍රධානත්වයෙන් යුතුව පැමිණි මෙම දූත පිරිස සමඟ පැවැති සාකච්ඡාව සඳහා ශ්‍රී ලංකා රජය පාර්ශවයෙන් විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය විජිත හේරත් මහතා සහ අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍ය හර්ෂණ නානායක්කාර මහතා මෙන්ම නියෝජ්‍ය අමාත්‍ය අරුන් හේමචන්ද්‍ර මහතා ද සහභාගි වූහ. එමෙන් ම අදාළ රේඛීය අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු සහ අනෙකුත් රාජ්‍ය ආයතන නියෝජනය කරමින් උසස් රාජ්‍ය නිලධාරීන් පිරිසක් ද එක්ව සිටියහ.

මාධ්‍ය ඒකකය
විදේශ, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය කාර්යාලය
කොළඹ 01
2026 ජූනි 15


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 2325372<br>2325373<br>2325375 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 2333450<br>2446091<br>2430220 | ඊමේල්<br>மின்அஞ;சல;<br>E-Mail | cypher@mfa.gov.lk | වෙබ් අඩවිය<br>இணைய தளம்<br>Web site | www.mfa.gov.lk |